# කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශාස්ත්‍ර පීඨය

## ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි දෙවන වසර පරීක්ෂණය

## පළමු සෙමෙස්තරය - 2019

## CMS 2113 - ගුවන්විදුලි මාධ්‍ය : න්‍යාය හා භාවිතය

ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න | කාලය පැය දෙකයි

---

01. 'ගුවන්විදුලිය විද්‍යුත් මාධ්‍යයක් වශයෙන් අද්විතීය ශක්‍යතා රැසකින් සමන්විත වෙයි.' නිදර්ශන සහිත ව විස්තර කරන්න.

*(ලකුණු 20)*

02. 'ශ්‍රී ලාංකේය ගුවන්විදුලි මාධ්‍යයේ ප්‍රභවය හා ව්‍යාප්තිය කෙරෙහි බ්‍රිතාන්‍ය යටත්විජිතවාදීන්ගේ සමාජ, ආර්ථික හා දේශපාලනික අරමුණු බලපෑම් කර තිබේ.' ගුවන්විදුලි මාධ්‍ය ඉතිහාසයේ සමාරම්භක යුගය කෙරෙහි සාවධාන ව පැහැදිලි කරන්න.

*(ලකුණු 20)*

03. පොදු සේවා ගුවන්විදුලි (Public Service Broadcasting) සංකල්පය සාර්ථක ව භාවිත කිරීම ග්‍රාහක අයිතිය ආරක්ෂා කිරීම කෙරෙහි බලපාන ආකාරය ජාතික හා අන්තර්ජාතික උදාහරණ ඇසුරින් සාකච්ඡා කරන්න.

*(ලකුණු 20)*

04. ශ්‍රී ලංකාවේ ප්‍රාථමික පාසැල් අධ්‍යාපනය බලාත්මක කිරීම සඳහා ගුවන්විදුලි අධ්‍යාපනික වැඩසටහන් භාවිත කළ යුතු ආකාරය උදාහරණ ඇසුරින් විස්තර කරන්න.

*(ලකුණු 20)*

*අනෙක් පිටුවට*

05. (අ) මාධ්‍ය පර්යේෂණ මගින් අධ්‍යයනය කෙරෙන මූලික ක්ෂේත්‍ර පිළිබඳ සංක්ෂිප්ත විවරණයක යෙදෙන්න.

*(ලකුණු 08)*

(ආ) ගුවන්විදුලි මාධ්‍යයේ අභිවර්ධනය කෙරෙහි ශ්‍රාවක පර්යේෂණ වැදගත් වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

*(ලකුණු 12)*

06. ගුවන්විදුලි මාධ්‍යය ජාතික සංවර්ධන අරමුණු කේන්ද්‍ර කරගත් පෙලඹුම්කාරකයක් වශයෙන් ක්‍රියාත්මක වන්නේ කෙසේදැයි දේශීය හා ගෝලීය නිදසුන් පාදක කරගනිමින් විවරණය කරන්න.

*(ලකුණු 20)*

**නැතහොත්**

'ගුවන්විදුලි මාධ්‍ය ආයතනයක් පිළිබඳ යහපත් ප්‍රතිරූපයක් ගොඩනැංවීමේදී නිවේදකයාගේ වෘත්තීයභාවය ඉතා වැදගත් වෙයි.' පැහැදිලි කරන්න.

*(ලකුණු 20)*